# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1784/11 - 2012 නොවැම්බර් මස 14 වැනි බදාදා - 2012.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී. - බී. 51/53 (iii)

**(437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත**

(437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 8 වන වගන්තිය යටතේ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද සමරසිංහ,
වැවිලි කර්මාන්ත අමාත්‍ය.

2012 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2012 අංක 05 දරන රබර් අලුතෙන් වගා කිරීමේ සහනාධාර (කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන - රබර් වගා කිරීමේ ව්‍යාපෘතිය - සම්ප්‍රදායික නොවන ප්‍රදේශ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. යම් වත්තක හෝ කුඩා ඉඩමක අයිතිකරුවකු වන යම් තැනැත්තකු විසින් තත් කාර්යය සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, එම වත්තේ හෝ කුඩා ඉඩමේ පළමුවන වරට රබර් වගා කිරීම සඳහා, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල මගින් ලබාදුන් කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටහන සඳහා ණය ලබාදීමට ඇති අරමුදල්වලින්, (අංක 712 එල්කේ) මේ නියෝගවල විධිවිධාන අනුව සහනාධාරයක්, රබර් පාලකවරයා විසින් ඒ තැනැත්තාට ගෙවනු ලැබිය හැකි ය.

3. 2 වන නියෝගය යටතේ සහනාධාරයක් ලබා ගැනීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම එම කාර්යය සඳහා රබර් පාලකවරයා විසින් කලින් කල සපයනු ලබන ආකෘතියකට සාරානුකූලව රබර් පාලකවරයා වෙත, කරනු ලැබිය යුතු ය.

4. (1) 2011 වර්ෂය හෝ ඉන් පසුව එළඹෙන වර්ෂයක් හෝ සඳහා රබර් පාලකවරයා විසින් නිකුත් කරන ලද රබර් අලුතෙන් වගා කිරීමේ අවසර පත්‍ර මත අනන්‍ය පෞද්ගලික අයිතියක් තිබෙන වත්තක හෝ කුඩා ඉඩමක සම්පූර්ණයෙන් ම හෝ එහි යම් නිශ්චිත කොටසක හෝ පළමුවනවරට රබර් වගා කිරීම සඳහා ගෙවනු ලබන සහනාධාර ප්‍රමාණය අලුතින් වගා කිරීමට ඇති හෙක්ටයාරයක් වෙනුවෙන් රුපියල් එක්ලක්ෂ පනස් දහසක් (රු. 1,50,000) වන අතර, එය පහත දැක්වෙන ආකාරයෙන් වාරික හයකින් ගෙවනු ලැබිය යුතු ය :—

(අ) වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයේ ඇති වෘක්ෂලතාදිය මුලින් උදුරා දැමීමෙන් සහ රබර් වගා කිරීම සඳහා වලවල් කැපීමෙන් පසුව, එසේ වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයේ එක් එක් හෙක්ටයාරයකට රුපියල් දාහතර දහස් අටසීය (රු. 14,800) බැගින් වූ පළමු වාරිකය ගෙවිය යුතු ය. වලවල් කැපීම සිදු කරනු ලබන තෙක් වාරිකය ගෙවීම නොකළ යුතු ය; ;

(ආ) වගා කිරීම සම්පූර්ණ කළ විට, එක් එක් හෙක්ටයාරයකට රුපියල් හැත්තෑ පන්දහස (රු. 75,000) බැගින් වූ දෙවන වාරිකය ගෙවිය යුතු ය. වගා කිරීම සම්පූර්ණ කළ බව දැනුම් දුන් විට මෙම මුදලින් 50%කට නොවැඩි මුදලක් වත්තේ හෝ කුඩා ඉඩමේ අයිතිකරුට කොටස් ගෙවීමක් වශයෙන් රබර් පාලකවරයා විසින් ගෙවනු ලැබිය හැකි ය. වගා කිරීමෙන් පසු පවත්වනු ලබන පරීක්ෂණයේ දී මේ වාරික මුදල ලැබීමට සුදුසු පරිදි සියලුම අවශ්‍ය වැඩ කොටස් සම්පූර්ණ කොට නොමැති බව පෙනී ගියහොත් සතුටුදායක අන්දමින් සම්පූර්ණ කර ඇති අයිතමයන් වෙනුවෙන් පහත සඳහන් පරිදි ගෙවීම් කරනු ලැබිය යුතු ය :—

| | හෙක්ටයාරයකට රුපියල් |
|---|---|
| වලවල් කැපීම හා බද්ධ පැල සිටුවීම | 37,500.00 |
| පාංශු සංරක්ෂණ කටයුතු (අගල් කැපීම හෝ ගල් වැටි හෝ වේදිකා යනාදිය ඉදිකිරීම) | 22,700.00 |
| ආවරණ බෝග සිටුවීම | 3,000.00 |
| වැට බැඳීම | 11,800.00 |

ගෙවීමට ඇති ඉතිරි මුදලක් වේ නම් නිම නොකළ වැඩ කොටස් සම්පූර්ණ කළ පසු පමණක් ගෙවනු ලැබිය යුතු ය. එසේ වුවත්, එම වැඩ කොටස් සම්පූර්ණ කරන තුරු වාරිකයේ ඉතිරි කොටස් අත්හිටුවනු ලැබිය යුතු ය ;

(ඇ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් පහළොස් දහස (රු. 15,000) බැගින් වූ තුන් වන වාරිකය වගා කිරීම සම්පූර්ණ කර අවුරුද්දකට නොඅඩු කාලයක් ගත වීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය ;

(ඈ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් පහළොස් දහස (රු. 15.000) බැගින් වූ හතර වන වාරිකය වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු දෙකකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය ;

(ඉ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් පහළොස් දහස (රු. 15,000) බැගින් වූ පස් වන වාරිකය වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු තුනකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය ;

(ඊ) එක් එක් හෙක්ටයාරයකට රුපියල් පහළොස් දහස් දෙසීය (රු. 15,200) බැගින් වූ හයවන වාරිකය වගා කිරීම සම්පූර්ණ කර අවුරුදු හතරකට නොඅඩු කාලයක් ගතවීමෙන් පසු ගෙවනු ලැබිය යුතු ය.

(2) එසේ වුවත්, ඉඩමක වැඩ කොටස් අවශ්‍ය අවම ප්‍රමිතියට ළඟා විය හැකි පරිදි මේ නියෝගයේ (1) වන ඡේදයේ (ඇ) සිට (ඊ) දක්වා වූ අනු ඡේදවල නියමිත කාලයන්ට පෙරාතුව සම්පූර්ණ කර ඇති බවට රබර් පාලකවරයා සෑහීමකට පත්වන්නේනම් ඔහුගේ අභිමතය පරිදි අදාළ වාරිකය නියමිත කාලයට පෙර මුදා හල හැකිය.

(3) වගා කර අවුරුදු හතක් ඉක්ම වූ පසු හෝ අදාළ වගාවෙහි කිරි කැපීම ආරම්භ කළ පසු හෝ ඉහත සඳහන් සහනාධාර වාරික කිසිවක් ගෙවීම කරනු නොලැබිය යුතු ය. මෙම නියෝගය 2011 වර්ෂය හෝ ඉන් ඔබ්බට නිකුත් කරනු ලබන අවසරපත්‍ර සඳහා වලංගු වේ.

(4) ක්ෂේත්‍රයේ පැල හිට වූ දිනය වගා කළ දිනය වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(5) වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයට හෙක්ටයාරයකට වඩා අඩුවන බිම් කොටසක් වන යම් අවස්ථාවක හෝ බිම් ප්‍රමාණයට හෙක්ටයාරයකට වඩා අඩු වන කොටසක් ඇතුළත් වන අවස්ථාවක දී, ගෙවිය යුතු සහනාධාර මුදල ගණනය කිරීමේ දී එම බිම් කොටසට අදාළ වන්නා වූ මෙම නියෝගයෙහි (1) වන ඡේදයෙහි සඳහන් වන අනුප්‍රමාණ එම බිම් ප්‍රමාණය හෝ එම බිම් ප්‍රමාණයෙහි කොටස එක් හෙක්ටයාරයකට දරන්නා වූ අනුපාතය අනුව අදාළ විය යුතු ය.

(6) (මෙහි මින් මතු "අවසර පත්‍ර ලාභියා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ඉඩමක රබර් වගා කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබූ රබර් වත්තක අයිතිකරුවකු විසින්, රාජ්‍ය බැංකුවක හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවක ශාඛාවක ජංගම ගිණුමක් හෝ ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කර පවත්වාගෙන යා යුතු ය. සියලු සහනාධාර ගෙවීම් ඒ ගිණුමට කරනු ලැබිය යුතු අතර, යම් සහනාධාර ගෙවීමක් සම්බන්ධයෙන් අයකර ගැනීමක් තිබේ නම්, ඒ ගිණුමෙන් අයකරගනු ලැබිය යුතු ය.

5. (1) මේ නියෝගවල 10 වන නියෝගය යටතේ රබර් පාලකවරයා විසින් නිකුත් කරනු ලබන විධාන, නියම කිරීම්, සීමා කිරීම් සහ තහනම් කිරීම්වලට අනුකූලව ක්‍රියා කිරීම සහ වගා කළ බිම් ප්‍රමාණය හොඳ කෘෂිකාර්මික තත්ත්වයකින් පවත්වාගෙන යාම මේ නියෝගවල 4 වන නියෝගය යටතේ සහනාධාරයේ පළමුවන වාරිකය ලැබූ සෑම අවසරපත්‍ර ධාරියකුගේ ම කාර්යය විය යුතු ය.

(2) වගා කිරීමට අලුත් අවසර පත්‍රයක් නිකුත් කරන ලද බිම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් 4 වන නියෝගය යටතේ සහනාධාර එක් වාරිකයක් හෝ ඊට වැඩි ගණනාවක් තවදුරටත් ගෙවීමට ඉතිරිව ඇත්තේ යම් අවසර පත්‍ර ලාභියකුට ද, ඒ අවසර පත්‍ර ලාභියා විසින් රබර් පාලකවරයාගේ ලිඛිත අනුමතය නොමැතිව එම මුලු බිම් ප්‍රමාණය හෝ ඉන් කොටසක් හෝ විකිණීම හෝ අන් අයුරකින් බැහැර කිරීම හෝ නොකළ යුතු ය.

6. (1) රබර් අලුතින් වගා කිරීම සඳහා වන අවසර පත්‍ර ලාභියකු වෙත සහනාධාරයේ පළමුවන වාරිකය ගෙවනු ලැබූ අවස්ථාවක දී වාරික මුදල ගෙවූ දින සිට අවුරුද්දක් ඇතුළත හෝ ඒ සඳහා රබර් පාලකවරයා විසින් වැඩිදුරටත් දෙනු ලැබිය හැකි වූ යම් කාලයක් ඇතුළත හෝ ඒ අවසරපත්‍රධාරියා විසින්,

(අ) වගා කිරීමට ඇති බිම් ප්‍රමාණයේ පවතින වෘක්ෂලතාදිය මුලිනුදුරා දැමිය යුතු ය ;

(ආ) රබර් පාලකවරයා විසින් අනුමත කරන ලද යම් වර්ගයකට හෝ වර්ගවලට අයත් රබර් පැලවලින් එම බිම් ප්‍රමාණය වගා කිරීම සම්පූර්ණ කළ යුතු ය ;

(ඇ) ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් රබර් පාලකවරයා විසින් නියම කරනු ලැබ ඇත්නම්, රබර් පැල හා භූමි ආවරණ රනිල පැලෑටි හැර සෙසු පැලෑටි ඒ බිම් ප්‍රමාණයෙන් ඉවත් කළ යුතු ය ;

(ඈ) රබර් පාලකවරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි පරිදි කාණු හෝ ගල්වැටි හෝ ඒ බිම් ප්‍රමාණයේ තැනිය යුතු ය ;

(ඉ) ඒ බිම් ප්‍රමණයේ භූමි ආවරණ රනිල පැලෑටි සිටුවීම හෝ පස සෝදා පාලුවීම වැලැක්වීම සඳහා රබර් පාලකවරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි පරිදි වෙනත් යම් පියවර ගැනීම හෝ කළ යුතු ය ; සහ

(ඊ) රබර් පාලකවරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඉල්ලා සිටිනු ලැබ ඇත්නම් එම බිම් ප්‍රමාණය වටා වැටක් ඉදි කළ යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති වැඩ ඉඩම් හිමියා විසින් නොකරන ලද අවස්ථාවන්හි දී, එම වැඩ කොටස් නිම කිරීම සඳහා අවශ්‍ය යැයි හැඟෙන තැනැත්තන් හා උපකරණ රබර් පාලකවරයා විසින් සේවයේ යෙදවිය හැකි ය.

(3) සුදුසු තැනැත්තන් සේවයේ යෙදවීම සඳහා රබර් පාලකවරයා විසින් දරන ලද වියදම ඉඩම් හිමියා වෙත ගෙවනු ලබන සහනාධාර මුදලින් අයකර ගනු ලැබිය යුතු ය.

7. (1) යම් බිම් ප්‍රමාණයක් වෙනුවෙන් සහනාධාරයක් හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවනු ලැබුවේ යම් අවසර පත්‍ර ලාභියකුට ද, ඒ සෑම අවසරපත්‍ර ලාභියකු විසින් ම පහත දැක්වෙන නියමයන් පිළිපැදීමට වගා බලාගත යුතු ය.

(අ) වගා කරන ලද එක් එක් හෙක්ටයාරයකට අවම රබර් පැල සංඛ්‍යාව, ඒ ඒ අවසරපත්‍ර ලභියා විසින් වගා කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය විසින් අනුමත කරන ලද (RRIC, RRISL) වර්ගයේ සහ වෙනත් වැඩි ඵලදාවක් සහිත බද්ධ රබර් පැල යොදා ගන්නා අවස්ථාවක -

(i) වගා කරන අවස්ථාවේ දී පැළ 516ක් ද ;

(ii) පළමු වර්ෂය හා දෙවන වර්ෂය අවසානයේ දී පැළ 516ක් ද ;

(iii) වගා කිරීම සම්පූර්ණ කළ පසු එළඹෙන තෙවන හා සිවුවන වර්ෂය අවසානයේ දී පැළ 475ක් ද ;

(iv) 8 වන නියෝගයේ (ආ) ඡේදයට අදාළව ඊළඟට එළඹෙන අනුක්‍රමික අවුරුදු දෙක හෝ තුන තුළ එක් එක් අවුරුද්ද අවසානයේ දී පැළ 450ක් ද, විය යුතු ය ;

(ආ) පහත නිශ්චිතව සඳහන් අනුමත දුර ප්‍රමාණයට අනුකූලව බද්ධ රබර් පැළ වගා කළ යුතු ය :—

(i) RRIC, RRISL වර්ගයේ පැළ සහ වෙනත් වැඩි ඵලදාවක් සහිත බද්ධ රබර් පැළ සඳහා :

| | | | |
|---|---|---|---|
| සෙ.මී. 350 X සෙ.මී. 550 | - | හෙක්ටයාරයකට | 516 |
| | - | (අක්කරයකට | 209) |

| | | | |
|---|---|---|---|
| සෙ.මී. 430 X සෙ.මී. 450 | - | හෙක්ටයාරයකට | 516 |
| | - | (අක්කරයකට | 209) |

(i) RRIC, RRISL වර්ගයේ සහ වෙනත් වැඩි ඵලදාවක් ඇති බද්ධ රබර් පැළ සමග අතුරු බෝග වගා කිරීම සඳහා :

| | | | |
|---|---|---|---|
| සෙ.මී. 250 X සෙ.මී. 775 | - | හෙක්ටයාරයකට | 516 |
| | - | (අක්කරයකට | 209) |

එසේ වුව ද, ඉහත නියම කළ දුර ප්‍රමාණයන් නොසලකා ඉඩමේ බිම් ප්‍රමාණය අනුව පැල සිටුවීම සඳහා වෙනත් දුර ප්‍රමාණයන් රබර් පාලකවරයා විසින් අනුමත කළ හැකි නමුත් පැල ප්‍රමාණය මේ නියෝගයේ (ආ) ඡේදයේ (i) හා (ii) වන අනු ඡේදවල දක්වා ඇති පැල ප්‍රමාණවලට වඩා අඩු නොවිය යුතු ය.

8. යම් බිම් ප්‍රමාණයක වගා කරන ලද රබර් පැලවල පොළවේ සිට සෙන්ටිමීටර් 121.92ක් උඩින් තිබිය යුතු අවම වට ප්‍රමාණය පහත සඳහන් පරිදි පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට වග බලා ගැනීම ඒ බිම් ප්‍රමාණය වෙනුවෙන් සහනාධාරයක් හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවනු ලැබූ සෑම අවසරපත්‍රලාභියකුගේම කාර්යය විය යුතු ය :—

(අ) එම ඉඩම් කොටස සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය සෙන්ටිමීටර් 254ක් සහ ඊට වැඩියෙන් ඇති දිස්ත්‍රික්කයක පිහිටා ඇති අවස්ථාවක මෙහි පහත I වන තීරයේ සඳහන් පරිදි විය යුතු ය ; සහ

(ආ) එම ඉඩම් කොටස සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය සෙන්ටිමීටර් 254ක් සහ ඊට අඩුවෙන් ඇති දිස්ත්‍රික්කයක පිහිටා ඇති අවස්ථාවක පහත II වන තීරයේ සඳහන් පරිදි විය යුතු ය :—

| *I වන තීරය* | *සෙන්ටිමීටර්* |
|---|---|
| අලුතෙන් වගා කිරීමෙන් පසු එළඹෙන දෙවන වර්ෂය අවසානයේ දී | 10.16 |
| අලුතෙන් වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වර්ෂය අවසානයේ දී | 15.87 |
| අලුතෙන් වගා කිරීමෙන් පසු එළඹෙන හතරවන වර්ෂය අවසානයේ දී | 25.40 |
| අලුතෙන් වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වර්ෂය අවසානයේ දී | 31.75 |
| අලුතෙන් වගා කිරීමෙන් පසු එළඹෙන හයවන වර්ෂය අවසානයට වඩා පසු නොවන කාලයක දී | 50.80 |

| *II වන තීරය* | *සෙන්ටිමීටර්* |
|---|---|
| අලුතෙන් වගා කිරීමෙන් පසු එළඹෙන දෙවන වර්ෂය අවසානයේ දී | 10.16 |
| අලුතෙන් වගා කිරීමෙන් පසු එළඹෙන තුන්වන වර්ෂය අවසානයේ දී | 13.97 |
| අලුතෙන් වගා කිරීමෙන් පසු එළඹෙන හතරවන වර්ෂය අවසානයේ දී | 22.86 |
| අලුතෙන් වගා කිරීමෙන් පසු එළඹෙන පස්වන වර්ෂය අවසානයේ දී | 27.94 |
| අලුතෙන් වගා කිරීමෙන් පසු එළඹෙන හයවන වර්ෂය අවසානයට වඩා පසු නොවන කාලයක දී | 50.80 |

9. යම් බිම් ප්‍රමාණයක වගා කරන ලද රබර් පැලවලින් යටත් පිරිසෙයින් සියයට හැටක්වත් පොළොවේ සිට මැනීමේ දී සෙන්ටිමීටර් 121.92 උසින් අවම වශයෙන් සෙන්ටිමීටර් 50.80 වට ප්‍රමාණය දක්වා වැඩෙන තෙක් රබර් ගස්වලින් කිරි නොකැපීම සඳහා අවශ්‍ය පියවර ගැනීම යම් ඉඩම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් සහනාධාරයක් හෝ ඉන් යම් කොටසක් හෝ ලබා ඇති සෑම බලපත්‍රලාභියකුගේ ම කාර්යය විය යුතු ය.

10. යම් අවසරපත්‍රලාභියකු වෙත 4 වන නියෝගය යටතේ සහනාධාරයක් ගෙවනු ලැබීමට ඇති අවස්ථාවක හෝ ගෙවා ඇති අවස්ථාවක රබර් පාලකවරයා විසින් ඒ සඳහා ලියවිල්ලකින් වූ දැන්වීමකින් නිශ්චිතව දක්වනු ලබන කාලය ඇතුළත රබර් වත්ත හෝ කුඩා ඉඩම හෝ සතුටුදායක අන්දමින් වගා කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි රබර් පාලකවරයා විසින් සලකනු ලබන්නා වූ ද, ඔහු විසින් ලියවිල්ලකින් නිකුත් කරනු ලබන්නා වූ ද, විධාන, නියම හෝ තහනම් කිරීම් අනුව ඒ අවසරපත්‍රලාභියා කටයුතු කළ යුතු ය.

11. රබර් පාලකවරයාගේ මතය අනුව -

(අ) සහනාධාරයක් හෝ ඉන් කොටසක් ගෙවනු ලැබූ යම් අවසරපත්‍රලාභියකු විසින් මේ නියෝගවල 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන නියෝගවල කවර හෝ විධානයක් කඩ කර ඇති අවස්ථාවක ; හෝ

(ආ) සහනාධාරය හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවනු ලැබ ඇති අවසරපත්‍රලාභියකුගේ නොසැලකිල්ල නිසා හෝ උද්යෝගිමත් ප්‍රයත්නයක් නොමැති නිසා හෝ බිම් ප්‍රමාණයක වගා කරනු ලැබූ රබර් පැල මේ නියෝගවල 8 වන නියෝගයෙහි නිශ්චිතව සඳහන් කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූල නොවන්නා වූ අවස්ථාවක ; හෝ

(ඇ) සහනාධාරයක් හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවනු ලැබ ඇති යම් අවසරපත්‍රලාභියකු තමා වෙත මේ නියෝගවල 10 වන නියෝගය යටතේ නිකුත් කරන ලද විධාන, නියම, සීමා කිරීම් හෝ තහනම් කිරීම් හෝ අනුව කටයුතු කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක,

එම බිම් ප්‍රමාණය සම්බන්ධයෙන් වූ සහනාධාරයෙන් ඒ තැනැත්තා වෙත ගෙවනු ලැබූ ප්‍රමාණය වහාම හෝ දැන්වීමෙහි සඳහන් කරනු ලබන කාලය ඇතුළත දී හෝ ආපසු ගෙවන ලෙස රබර් පාලකවරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමකින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි අතර, මෙම නියෝගය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබ ඇති සෑම තැනැත්තකු විසින් ම, ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු නොලැබිය යුතු ය.

12. මේ නියෝග යටතේ වූ බලතල පැවරීමේ බලය හැර රබර් පාලකවරයා විසින් තමාගේ අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින් මේ නියෝග යටතේ තමා සතුවී ඇති හෝ නියම වී ඇති හෝ පැවරී ඇති බලතල කාර්යය හෝ කර්තව්‍ය අතරින් යමක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත පැවරිය හැකි ය.

13. (අ) 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන හෝ 11 වන නියෝගවල විධිවිධාන කඩකරන්නා වූ ; හෝ

(ආ) මේ නියෝග යටතේ වූ යම් ඉල්ලුම් පත්‍රයක හෝ ප්‍රකාශනයක අසත්‍ය බව තමන් දන්නා යම් වැදගත් කරුණක් ප්‍රකාශ කරන්නා වූ ; හෝ

(ඇ) සහනාධාරයක් ඉල්ලන ඉල්ලුම්කරුවෙකු හෝ සහනාධාර ලබා ගත් තැනැත්තකු වශයෙන් රබර් පාලකවරයා වෙත යම් අසත්‍ය තොරතුරක් සපයන්නා වූ,

සෑම තැනැත්තෙකු ම වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර එකකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

14. මෙවැනි යෝජනා ක්‍රමයක් යටතේ රබර් පාලකවරයා විසින් සහනාධාර, පැළ, පොහොර හෝ වෙනත් ප්‍රදාන ලෙස යම් පුද්ගලයකුට ගෙවනු ලැබූ යම් මුදල් ප්‍රමාණ ආපසු ගෙවීමක් කර නොමැති විටක දී, අධිකරණයක් මගින් පනවනු ලැබූ දඩයක් ලෙස එම මුදල් ප්‍රමාණ ආපසු අය කර ගත හැකි අතර, සහනාධාර වාරික එකක් හෝ වැඩි ගණනක් ලබා ගැනීමෙන් අනතුරුව එම සහනාධාර නොගෙවා යම් පුද්ගලයකු විසින් කුඩා ඉඩමක් හෝ වත්තක් අත්හැර දැමූ බවට රබර් පාලකවරයා විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් මේ සඳහා සාක්ෂි ලෙස ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වන්නේ ය.

15. කලින් කල සංශෝධිත පරිදි වූ 1977 මාර්තු මස 23 වන දින අංක 258 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද්දා වූ රබර් නැවත වගා කිරීමේ සහනාධාර (නව යෝජනා ක්‍රමය) නියෝගවල විධිවිධානයන්හි කුමක් සඳහන්ව තිබුණ ද, පිළිවෙලින් 2008, 2009, 2010 සහ 2011 වර්ෂ වෙනුවෙන් නිකුත් කරන ලද රබර් අලුතෙන් වගා කිරීමේ අවසර පත්‍ර මත ගෙවනු ලැබිය යුතු මෙහි පහත සඳහන් සහනාධාර වාරික මෙම නියෝගවල 4 වන නියෝගයෙහි නියම කරනු ලැබ ඇති අනුප්‍රමාණවලට අනුව පහත දැක්වෙන ආකාරයට ගෙවනු ලැබිය හැකි ය. එසේ වුවත්, මෙම වාරික ගෙවිය යුත්තේ මේ නියෝග ක්‍රියාත්මක කරන අවස්ථාවේ දී එම අවසර පත්‍රය මත ගෙවිය යුතු වාරික සියල්ලම ගෙවා නොමැති නම් පමණී :

පුද්ගලික අයිතිය යටතේ ඇති වතු සහ කුඩා ඉඩම් :

| | | |
|---|---|---|
| 2008 වර්ෂය | - | මෙම නියෝගවල 4 (1)(ඉ) නියෝගයට අනුකූලව පස්වන වාරිකයේ සිට ඉදිරියට ; |
| 2009 වර්ෂය | - | මෙම නියෝගවල 4 (1)(ඈ) නියෝගයට අනුකූලව හතරවන වාරිකයේ සිට ඉදිරියට ; |
| 2010 වර්ෂය | - | මෙම නියෝගවල 4 (1)(ඇ) නියෝගයට අනුකූලව තුන්වන වාරිකයේ සිට ඉදිරියට ; |
| 2011 වර්ෂය | - | මෙම නියෝගවල 4 (1)(අ) සහ (ආ) නියෝගවලට අනුකූලව පළමුවන වාරිකයේ සිට ඉදිරියට ; |

16. මෙම නියෝගවල :

"අයිතිකරු" යන්නට (436 වන අධිකාරය වූ) රබර් පාලන පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතුය ;

"වත්ත" යන්නෙන්, රබර් ගස්වලින් කිරි එකතු කර ගැනීම සඳහා රබර් පැල වවනු ලබන විශාලත්වයෙන් හෙක්ටයාර් 4.04ට නොඅඩු ඉඩම් කොටසක් අදහස් වේ ;

"අළුතින් වගා කිරීමේ අවසර පත්‍ර" යන්නෙන් (436 වන අධිකාරිය වූ) රබර් පාලන පනතේ 7(1) වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් අදහස් වේ ;

"කුඩා ඉඩම" යන්නෙන්, රබර් ගස්වලින් කිරි එකතු කර ගැනීම සඳහා රබර් පැල වවනු ලබන විශාලත්වයෙන් හෙක්ටයාර් 4.04කට අඩු ඉඩමේ කොටසක් අදහස් වේ. තව ද, ;

"රබර් පාලකවරයා" යන්නෙන් රබර් පාලන පනත යටතේ පත්කරන ලද හෝ පත්කරනු ලැබූ ඇතැයි සලකනු ලබන රබර් පාලකවරයකු අදහස් වන අතර රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද ඇතුළත් වන්නේ ය.

11 - 1030

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.